# කොළඹ විශ්ව විද්‍යාලය
## ශාස්ත්‍ර පීඨය
## ශාස්ත්‍රවේදී දෙවන වසර පරීක්ෂණය (ආර්ථික විද්‍යාව) - 2018
## (දෙවන සෙමෙස්තර වාර අවසාන පරීක්ෂණය)
# ECN 2231: කළමනාකරණ න්‍යායන් සහ භාවිතයන්
## කාලය - පැ දෙකයි (02)

**ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.**

---

1.

I. කළමනාකරණය යනු කුමක්ද? සංවිධානයක පැවැත්ම සඳහා කළමනාකරණය අත්‍යවශ්‍ය වන්නේ මන්ද? (ලකුණු 13)

II. කාර්යක්ෂමතාවය, සඵලදායකත්වය හා ඵලදායකත්වය යන කළමනාකරණ සංකල්ප අර්ථ දක්වා එම සංකල්ප අතර අන්තර් රැඳියාව පැහැදිලි කරන්න. (ලකුණු 12)

2.

I. කළමනාකරණ දැනුම, කුසලතා හා ආකල්ප ලෙස ඔබ අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 10)

II. වඩා හොඳ කළමනාකරුවෙකු වීම සඳහා ඉහත ලක්ෂණ අවශ්‍ය බැව් ඔබ සිතන්නේ මන්ද? ඔබේ පිළිතුර උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 15)

3.

I. ගැටුම් කළමනාකරණයේ උපාය මාර්ග පහ මොනවාද? සුදුසු රූප සටහන් භාවිතයෙන් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 12)

II. ආධිපත්‍යය (බලය යොදා ගැනීම) ගැටුම් කළමනාකරණය කිරීමේ සාර්ථක උපකරණයක් ලෙස ඔබ නිර්දේශ කරන්නේ කුමන තත්වයක් යටතේද? (ලකුණු 13)

4.

I. සංවිධානයක දැක්ම සහ මෙහෙවර ප්‍රකාශයන්හි වැදගත්කම සාකච්ඡා කරන්න. (ලකුණු 10)

II. SWOT විශ්ලේෂණය, සැලසුම් උපකරණයක් ලෙස විස්තර කර ඔබ සතු පුද්ගලික නිපුණතාවයන් එම විශ්ලේෂණය යොදා ගනිමින් පෙන්වා දෙන්න. (ලකුණු 15)

5.

I. සැලසුම්කරණ ක්‍රියාවලියේ ප්‍රධාන අදියර විස්තර කර, තෝරාගත් අවස්ථාවක් සඳහා මෙම ක්‍රියාවලිය යොදා ගන්න. (ලකුණු 10)

II. "සංකීර්ණ පරිසරයන් තුළ සැලසුම්කරණය අර්බුදකාරී වී ඇත". මෙම ප්‍රකාශය උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 15)

6.

I. කළමනාකරණ කාර්යක් ලෙස, "සංවිධානකරණය" යනු කුමක්ද? (ලකුණු 05)

II. ප්‍රධාන සංවිධාන ව්‍යුහ වර්ග මොනවාද? කර්මාන්ත ආශ්‍රිත නිදසුන් ඇසුරින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

III. උස් සංවිධාන ව්‍යුහයන් (Tall Organizational Structure) සහ පැතලි සංවිධාන ව්‍යුහයන්හි (Flat Organizational Structure) වාසි අවාසි සාකච්ඡා කරන්න. (ලකුණු 10)

7.

I. සැලසුම්කරණයේ මට්ටම් හා විවිධ පරිමාණයේ සංවිධාන උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10)

II. විවිධ සැලසුම්කරණ වර්ග මොනවාද? ඔබේ පිළිතුර ව්‍යාපාරික පරිසරයෙහි ඇති උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 15)